ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
**සැප්තැම්බර් 2018**

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**
නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල


වැදගත් කරුණු:

## නිෂ්පාදන අංශය අඩු වේගයකින් වර්ධනය විය

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2018 අගෝස්තු මස වාර්තා කළ 58.2 ක අගයට සාපේක්ෂව 2018 සැප්තැම්බර් මාසයේ දී 54.1 ක දර්ශක අගයක් දක්වා අඩු විය. මෙම අඩු වර්ධනය සඳහා, විශේෂයෙන්ම ආහාර සහ පාන අංශය ඇතුළුව, නව ඇණවුම් සහ නිෂ්පාදන වල වර්ධනය අඩු වීම හේතු විය. සමීක්ෂණයට ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කළ පරිදි, රුපියල අවප්‍රමාණය වීමත් සමඟම ආනයනික අමුද්‍රව්‍යයන්හි මිල ඉහළ යෑම හේතුවෙන්, භාණ්ඩ වල මිල ඉහළ දැමීමට සිදු විය. එම නිසා, භාණ්ඩ වල ඉල්ලුම පහත වැටුණු අතර, එය නව ඇණවුම් සහ නිෂ්පාදන වල වර්ධනය අඩුවීමට හේතු විය. කෙසේ වුවද, වැඩි වශයෙන් අපනයන නැඹුරුතාවක් සහිත, රෙදිපිළි හා නිමි ඇඳුම් අංශයෙහි නව ඇණවුම් සහ නිෂ්පාදන ඉහළ යන ලදී. තවද, සේවා නියුක්තිය සහ ගැනුම් තොග ද යම් අඩු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ඉහළ යාම තුළින් මෑතකාලීනව ආර්ථිකය වර්ධනය වන බව සාමාන්‍යයෙන් පිළිඹිබු වේ. එනමුත්, මෙම මස තුළදී ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යම් වැඩිවීමක් පෙන්නුම් කරන ලද්දේ, නිෂ්පාදකයින් විසින් රුපියල ස්ථාවර වේ යැයි බලාපොරොත්තුවෙන් සැපයුම් ලබාගැනීමට වැඩි කාලයක් ගත කිරීම හේතුවෙනි. එම නිසා, ආර්ථික ක්‍රියාකාරකම්හි වැඩිවීමක් එමඟින් පිළිඹිබු නොවේ. සමස්තයක් ලෙස, ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලදී. ඒ අනුව, 2018 සැප්තැම්බර් මාසයේ දී නිෂ්පාදන ක්‍රියාකාරකම්, 2018 අගෝස්තු මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය වූ බව පෙන්නුම් කෙරෙයි.

| | ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජුනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | **2017** | 56.2 | 57.1 | 66.5 | 41.8 | 57.9 | 56.1 | 54.3 | 54.4 | 59.0 | 54.8 | 58.8 | 59.1 |
| | **2018** | 51.7 | 55.6 | 65.6 | 45.5 | 60.6 | 57.6 | 57.2 | 58.2 | **54.1** | - | - | - |

| විචලයය | අගෝ. | සැප්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **58.2** | **54.1** | **-** | **අඩු වේගයකින්, ඉහළ** |
| | | **උප දර්ශක** | | |
| **නව ඇණවුම්** | 60.5 | 53.0 | - | අඩු වේගයකින්, ඉහළ |
| **නිෂ්පාදන** | 60.5 | 53.5 | - | අඩු වේගයකින්, ඉහළ |
| **සේවා නියුක්තිය** | 56.5 | 55.5 | - | අඩු වේගයකින්, ඉහළ |
| **ගැනුම් තොගය** | 57.0 | 56.0 | - | අඩු වේගයකින්, ඉහළ |
| **ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය** | 53.0 | 54.0 | + | වැඩි වේගයකින්, ඉහළ |




## සේවා අංශයෙහි වර්ධනය තවදුරටත් පහළ යන ලදී

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2018 අගෝස්තු මාසයේ දී වාර්තා වූ 57.0 ක දර්ශක අගයට සාපේක්ෂව 2018 සැප්තැම්බර් මාසයේ දී 53.0 ක දර්ශක අගයක් දක්වා පහළ යන ලදී. ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පිලිබඳ සමීක්ෂණය ආරම්භ කළ 2015 මැයි මස සිට වාර්තා වූ පහළම අගය වාර්තා කරමින්, 2018 සැප්තැම්බර් මාසයේ දී සේවා අංශය අඩු වේගයකින් වර්ධනය වූ බව මෙමගින් පෙන්නුම් කෙරෙයි. නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා, තොග සහ සිල්ලර වෙළඳාම, සෞඛ්‍ය සේවා සහ අනෙකුත් පෞද්ගලික සේවා යන අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයෙහි සිදු වූ සැලකිය යුතු පසුබෑම සේවා අංශයෙහි වර්ධනය අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. සංචාරකයන් අඩු වශයෙන් මෙරටට පැමිණෙන කාලයක් වීම සහ ආනයන පරිමාව අඩු වීම ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයෙහි පසුබෑමට ප්‍රධාන හේතු ලෙස සඳහන් කර තිබුණි. තවද, නව ව්‍යාපාර වර්ධනයේ පසුබෑමට මූල්‍ය සේවා සහ රක්ෂණ යන අංශවල වර්ධනයේ අඩු වීම හේතු විය. සැප්තැම්බර් මාසයේ දී සේවා නියුක්ති මට්ටම අඩු වේගයකින් වර්ධනය වූ අතර ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනය පහළ යෑම ද ඊට හේතුවක් විය. සේවා සපයන්නන්ගේ ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිලිබඳ සුබවාදී අපේක්ෂා ද අඩු වේගයකින් වර්ධනය විය. ඉන්ධන මිල ඉහළ යෑම, රුපියල අවප්‍රමාණය වීම සහ ආනයන මත පනවා ඇති සීමාවන් ඔවුන්ගේ සුබවාදී අපේක්ෂා කෙරෙහි අහිතකරව බලපෑ බව ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කර තිබුණි. ඉන්ධන මිල ඉහළ යෑම සහ රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් සේවා අංශයේ අයකරන මිල ගණන් වැඩි වේගයකින් ඉහළ යන ලදී. සැප්තැම්බර් මාසය තුල දී සේවා අංශයේ අපේක්ෂිත ශ්‍රම පිරිවැය ද ඉහළ ගියේය.

| | ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජුනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | **2017** | 57.5 | 57.3 | 60.8 | 54.2 | 55.3 | 59.2 | 59.1 | 60.1 | 57.0 | 55.3 | 57.4 | 61.2 |
| | **2018** | 56.6 | 58.4 | 58.0 | 53.2 | 56.9 | 58.7 | 57.8 | 57.0 | **53.0** | - | - | - |

| විචල්‍යය | අගෝ. | සැප්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **57.0** | **53.0** | **-** | **අඩු වේගයකින්, ඉහළ** |
| | | <u>**උප දර්ශක**</u> | | |
| නව ව්‍යාපාර | 60.0 | 55.2 | - | අඩු වේගයකින්, ඉහළ |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 63.7 | 51.0 | - | අඩු වේගයකින්, ඉහළ |
| සේවා නියුක්තිය | 55.8 | 54.2 | - | අඩු වේගයකින්, ඉහළ |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 42.8 | 45.0 | + | අඩු වේගයකින්, පහළ |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 62.8 | 59.6 | - | අඩු වේගයකින්, ඉහළ |

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




***තාක්ෂණික සටහන:***

### දර්ශකය

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසදීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

### නියැදිය

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

### විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.